දිනය :-2014.12.10

අංකය:- 12353

<u>ඉඩම් ණය ගිවිසුමයි.</u>

රුපියල් : 1,000,000.00

බත්තරමුල්ල ,සෙත්සිරිපාය දරණ ස්ථානයෙහි රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය පළමුවන පක්ෂයට ද,

මාලඹේ,පොතුඅරාව පාර,අංක:1035 දරණ ස්ථානයෙහි පදිංචි හේවා කංකානමගේ සුපුන් මිහිඳු පෙරේරා මහතා දෙවන පක්ෂයට බැඳී ඇති කරගනු ලබන ඉඩම් විකිණීමේ පොරොන්දු ගිවිසුමයි.

ඉහත කී පළමුවන පක්ෂයට අයිති මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපල පහත සදහන් පොරොන්දු සහ කොන්දේසි වලට යටත්ව දෙවන පක්ෂයට විකිණීමට ද එකී දෙවන පක්ෂය ද එම පොරොන්දු සහ කොන්දේසි වලට යටත්ව එකී දේපල මිලයට ගැනීමට ද මෙයින් එකගව ගිවිස ගන්නා ලදී

<u>ඉහත කී පොරොන්දු සහ කොන්දේසි වන්නේ.</u>

01. ඉහත කී පළමුවන පක්ෂය විසින් මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන ඉඩම දෙවන පක්ෂයට විකුණනු ලබන මුලු මුදල වන්නේ රුපියල් විසිලක්ෂ හතලිස්හයදහස (රුපි 2,046,000:/-) කි

02. එම මුදලින් අද දින අත්තිකාරම් වශයෙන් රුපියල් දෙලක්ෂ දසදහස (රුපි:210,000/-) ක මුදලක් දෙවන පක්ෂය විසින් පළමුවන පක්ෂයට ගෙවනු ලැබේ.

03. ඉතිරි මුදල එක්ලක්ෂ දෙදහස (රුපි:102,000/-) ක් බැගින් මාසික වාරික දහඅටකින් ගෙවා නිම කර එකී දේපල දෙවන පක්ෂයේ නමින් පවරා ගැනීමට මෙයින් පොරොන්දු වේ.

04. ඉහත කී පළමුවන පක්ෂය විසින් එකී දේපල ගිවිසුම් කාලය තුල දී වෙනත් පාර්ශවයකට නොපැවරීමටත් දේපලෙහි අගය අඩු වන කිසිදු ක්‍රියාවක් නොකිරීමටත් පළමුවන පක්ෂය මෙයින් පොරොන්දු වේ.

05. ඉහත කී වාරික සෑම මසකම අවසන් දිනට පෙර ගෙවීමට දෙවන පක්ෂය මෙයින් පොරොන්දු වේ.

06. නියමිත දිනවලදී වාරික මුදල් ගෙවීමට අපොහොසත් වුවහොත් එකී වාරිකයක් සඳහා ගතවන කාලයට මසකට සියයට පහ (5%) බැගින් පොලී මුදලක් ගෙවීමට දෙවන පක්ෂය මෙයින් පොරොන්දු වේ.

## ඉහත කී උපලේඛනය.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට අයත් සියනෑ කෝරලේ අදිකාරි පත්තුවේ මහර ප්‍රාදේශිය සභා සීමාව තුල සහ මහර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ වෑබඩ බටහිර ගමෙහි පිහිටි ''තලගහවත්ත සහ ගොරකගහවත්ත'' නැමැති ඉඩමෙන් බෙදා වෙන් කල අංක:07 දරණ කොටසට වරුණ අජන්ත යාපා බලයලත් මිනින්දෝරු තැන විසින් 2012.03.30 වෙනි දින මැණ සාදන ලද අංක: 4064 දරණ සැලැස්ම ප්‍රකාර මායිම් :- උතුරටඃ කැබලි අංකඃ05 ද නැගෙනහිරටඃ කැබලි අංකඃ06 ද දකුණටඃ ඩබ්.පි.සෝමරත්නට අයිති ඉඩමද බස්නාහිරටඃ කුඹුරද යන මායිම් තුල පිහිටි පර්චස් දහ හතරයි දශම පහ (අඃ00-රූඃ00-පඃ14.5) ක් විශාල ඉඩම සහ ඊට අයිති ගසකොළ පළතුරු ආදී සියලු දේත් වේ.

තවද, ඉහත කී අංකඃ 4064 දරණ සැලැස්මේ අංකඃ04 දරණ කොටස අඩිඃ15 ක් පළල මාර්ගයක් වශයෙන් භාවිතා කිරීමේ මාර්ග අයිතියත් සමග වේ.

ඊට සාක්ෂි පිණිස ඉහත කී දෙපක්ෂය,මීටත් මෙම වාසගම සහ දිනත් දරණ තව ලියවිලි දෙකකටත් වර්ෂ දෙදහස් දහහතරක් වු පෙබරවාරි මස වෙනි දින මිනුවන්ගොඩදී අත්සන් තැබුවෙමු.

සාක්ෂි

මිට සාක්ෂිකාරයන් වන අපි මෙහි අත්සන් කළ අය හොදාකාරව අදුනන බව සහ එම අයගේ සම්පුර්ණ නම් රක්ෂාව සහ පදිංචි ස්ථානත් හොදින් දන්නා බවද මෙයින් සහතික කරමු.

1.

2.

ප්‍රසිද්ධ නොතාරිස් තැන